# කතෘ කාරක හා කර්ම කාරක වාක්‍ය සාධනය

11 ශ්‍රේණිය

දේශක - ඉරෝෂණී පුශ්පකුමාරි

බප/මිනු පස්යාල මහා විද්‍යාලය

# කතෘ කාරක වාක්‍ය

කාර + ක > කාරක- ක්‍රියාව කරන්නා

ක්‍රියාව කරන්නා

ළමයා පොත කියවයි

කතෘ කර්මය ක්‍රියාව

# ළමයා පොත කියවයි.

- "කියවයි" යන ආඛ්‍යාතය මගින් ඔබව කරනු ලබන්නේ කවුරුන් විසින්ද?

-පිළිතුර: ළමයා

<u>ළමයා</u> යන්න එම වාක්‍යයේ උක්තයයි.

# වැදගත්(සාරාංශය)

- ඒ අනුව වාක්‍යයේ ක්‍රියාව ( ආඛ්‍යාතය ) කරන්නේ ළමයායි.
- වාක්‍යයේ එන ක්‍රියාව කරන්නේ ' කර්තෘ ' නම් ඒ වාක්‍යය කර්තෘ කාරක වාක්‍යයකි.
- ඒ අනුව කර්තෘ කාරක වාක්‍යයේ ආඛ්‍යාතය කරන්නා හඳුන්වන පදය නිශ්චිත රූපයෙන් ලියන විට එහි අන්තයට ' ක, කු, න් ' යනුවෙන් කිසිදු විටක නොපිහිටයි.

# කර්ම කාරක වාක්‍යය

- මෙහිදී අපි කර්තෘ කාරකයෙන් කර්ම කාරකය වෙන් කෙරෙන්නේ කෙසේදැයි විමසා බලමු.

- ගොවියෝ ගවයන් බදිති ← කර්තෘ කාරකය

ගොවියෝ → කර්තෘ උක්තය
ගවයන් → කර්මය
බදිති → අවසාන ක්‍රියාව/ ආඛ්‍යාතය

- ගොවියන් විසින් ගවයෝ බැදෙති ← කර්ම කාරකය

ගොවියන් → කර්තෘ අනුක්තය
ගවයෝ → කර්ම උක්තය
බැදෙති → අවසන් ක්‍රියාව / ආඛ්‍යාතය

# ඉහත වාක්‍ය අධ්‍යනයේදී

- කර්තෘ කාරකයේ දී ආඛ්‍යාතය කළේ කර්තෘ.
- කර්ම කාරකයට නැගීමේදී ආඛ්‍යාතය කරන්නේ කර්මයයි.
- කර්තෘ කාරයකයේ දී ආඛ්‍යාතය කළ කර්තෘ උක්ත වේ.
- කර්ම කාරකයේ දී ආඛ්‍යාතය කරන්නේ කර්මය බැවින් කර්තෘගෙන් ඉවතට ගන්නා උක්ත රූපය කර්මයට ආරෝපණය කරයි.
- එවිට කර්මය උක්ත රූපයෙන් තබයි.

# කර්ම කාරක වාක්‍යයේදී අවධානය යොමු කළ යුතු කරුණු

- කර්තෘ කාරකයේදී කර්තෘ ආඛ්‍යාතය කරන්නේ සිය උවමනාවෙන්ම බැවින් ඒවා උත්සාහක ක්‍රියා විශේෂයකි.

- නමුත් කර්ම කාරයකයේදී ආඛ්‍යාතය කරන්නේ අනායනසෙයෙනි.

- එහෙයින් කර්ම කාරක ආඛ්‍යාතය නිරුත්සාහක අනුත්සාහක ක්‍රියා විශේෂයකි. ඒවා කරන ක්‍රියා නොව ඉබේ සිදුවන / කෙරෙන ක්‍රියා බවට පත් වෙයි.

- කර්ම කාරකයේදී අනුක්ත කර්තෘට පසුව ' **<u>විසින්</u>** ' යනුවෙන් නිපාතයක් බොහෝ විට යෙදෙයි.

උදා : ළමයා **<u>විසින්</u>** පොත බැලෙයි.

ගුරුවරුන් **<u>විසින්</u>** සිසුහු යහමග යැවුණෝය.

වල් අලින් **<u>විසින්</u>** වගා පාළු කෙරිණ.

අනුක්ත කර්තෘත්වයෙන් පසු යෙදෙන "විසින්" නිපාතය රහිතව ද කර්ම කාරක වාක්‍ය ලියවෙනු අපට දැක ගත හැකිය.

බොහෝ විට එසේ යොදන්නේ පුවත්පත්වල ශීර්ෂ පාඨ සඳහායි.

- උත්සවයේ සියලු කටයුතු සාර්ථක ව කෙරේ.
- සියලු වැරදිකාරයෝ අත්අඩංගුවට ගැනුණාහ.

කර්ම කාරක වාක්‍යවල ආඛ්‍යාතය අනතීත කාලය පෙන්වීම දෙයාකාරයකින් දැක්විය හැක.

- නිරුත්සාහක- කෙරෙයි, කෙරේ, නැටෙයි, නැටේ

බැලෙති, නැංවෙති, ඇදෙති

- "නු" සහිත (කර්ම කාරක ) කෘදන්ත (භාව ක්‍රියාව ) සමග "ලබ" ධාතුවෙන් සාදන ක්‍රියා රූප

කරනු ලැබේ/ කරනු ලබයි.

බලනු ලැබේ/ බලනු ලබයි.

නටනු ලබති/ බලනු ලබති.

- "ලබ" ධාතුවේ ක්‍රියා රූපය ද නිරුත්සාහයක ස්වරූපයෙන් ලිවීම.

කරනු ලැබෙයි - බලනු ලැබෙයි

කෙරෙනු ලැබේ- බැලෙනු ලැබෙයි

අදිනු ලැබෙයි- බඳිනු ලැබෙති

අතීත කාල ආඛ්‍යාත පද ද තෙයාකාරයකින් සාදා ගත හැක.

- නිරුත්සාහයක- බැඳිණි, වැටිණි, බැලිණි, බැඳුණු, වැටුණු

"න" (කර්ම කාරක ) ප්‍රත්‍යය සහිත කෘදන්තය (භාව ක්‍රියාව )සමග ලද ධාතුවෙන් තනා ගත් ආඛ්‍යාත රූප

කරන ලදී, කරන ලද්දේය.

නටන ලදී, නටන ලද්දේය.

අදින ලදහ, අදින ලද්දේය.

"නු" කර්ම කාරක ප්‍රත්‍යය කාරක ප්‍රත්‍යය යෙදුණු "කෘදන්තය" සමග "ලබ" ධාතුවෙන් සාදා ගත් ආඛ්‍යාත රූප

කරනු ලැබිණි,නටනු ලැබිණි

අඳිනු ලැබිණි, කරනු ලැබුණු

# අවසානය



තව දුරටත් උදාහරණයකින් මේ සියළු කාර්යන්හි **සාරාංශය** අපි විමසා බලමු.

ගොවියෝ හරකුන් බඳිති- කර්තෘකාරක වාක්‍ය කර්ම කාරකයට හැරවීම.

- උක්ත කර්තෘ අනුක්ත කරන්න.

  ගොවියෝ > ගොවියන්

- විසින් නිපාතය එකතු කරන්න

  ගොවියන් විසින්

- අනුක්ත කර්මය උක්ත කරන්න

  හරකුන් > හරක්

- අලුතින් සාදා ගත් උක්තයට (හරක්) සරිලන පරිදි හා දී ඇති වාක්‍යයේ කාලයට ( අතීත / අනතීත ) සරිලන ආඛ්‍යාතය ගලපන්න.

  බඳිති > බැඳෙති / බඳිනු ලබති / බඳිනු ලැබෙති /බැඳෙනු ලැබෙති .

**අවසානය - ගොවියන් විසින් හරක් බැඳෙති.**

පහත කර්තෘ කාරක වාක්‍යය කර්ම කාරකයට හරවන්න.

1. අතීත රජවරු වැව් සෑදුවෝය.
2. සරසවි ඇදුරෝ සිසුන් අතරමං කරති.
3. කොන්තරාත්කරුවා කම්කරුවන් සේවයේ යෙදවීය.
4. වන ඇත්තු වගා පාළු කරති.
5. උපාසිකාව බණ පොත පෙරළුවාය.